


# ලක්ෂ්මන් ගේ පොත් දොරට වැඩිය දා

සිඩ්නි වාසී දක්ෂ ලේඛකයකු වන ලක්ෂ්මන් කොඩිතුවක්කු ගේ "පරමේෂ්වරී සහ තවත් රටක්" සහ "පුංචි ටොමී සිඩ්නි ගියා" පොත් දෙක දොරට වැඩීමේ උත්සවය ජුනි 6 වන දින සිඩ්නි බිලැක්ටවුන් සිංහල භාෂා පාසලේදී පැවැත්වුණි. මේ එහි අවස්ථා කීපයකි.





# වෙසක් පෝයට 500 ක් සිල් සමාදන් වෙති





ලොව්තුරා සම්මා සම්බුදු රජානන් වහන්සේ බුද්ධත්වයට පත් වී 2600 වන වසර ආරම්භවීම නිමිත්තෙන් ඩැන්ඩිනොන් ධම්මදීප භාවනා මධ්‍යස්ථානයේ අධිපති පූජ්‍යපාද අකරවිට සංඝානන්ද ස්වාමින්වහන්සේ ගේ සංකල්පනාවකට අනුව පසුගිය මැයි මස 29 වන දින 500 කට ආසන්න පිරිසක ගේ සහභාගිත්වයෙන් මහා ශීල ව්‍යාපාරයක් නෝබල් පාක් ඉංග්‍රීසි භාෂා විද්‍යාලයීය ශාලාවේදී පැවැත්වුණි.

බුදු පියාණන් වහන්සේ උදෙසා පහන් 2600 ක් බෞද්ධ කොඩි 2600 ක් සහ මල් 2600 ක් පිදුණ අතර සුදෝ සුදුවතින් සැරසුණ සැදැහැතියන්ගේ දසුන පහන් සංවේගය දනවන සුලු විය.

එදින වැඩසටහනට ඇතුළත් වූ ධර්ම දේශණා පූජ්‍ය අකරවිට සංඝානන්ද කොළඹ 7 විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ අධිපති හාරිස්පත්තුවේ ආරියවංශාලාකාර සහ වලස්ගල ඥානසිරි යන ස්වාමින් වහන්සේලා විසින් පවත්වන ලදී.

ජගත් කොතලාවල